# ගුරු වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල - 2012

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය ව්‍යාචනය

මෙම වාර්තාවේ 1.2.1 ඡේදයේ දක්වා ඇති වැදගත් කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

#### 1.2.1 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අරමුදල වෙනුවෙන් වෙනම බැංකු ගිණුමක් හා ඊට අදාල ගනුදෙනු සටහන් කරන ලද මුදල් පොතක් නොතිබූ හෙයින් සමාලෝචිත වර්ෂය වෙනුවෙන් අරමුදලට ලැබුණු හා ගෙවන ලද මුදල් පිළිබඳ තොරතුරු පරික්ෂා කළ නොහැකි විය.

(ආ) 2012 වර්ෂය වෙනුවෙන් පිළියෙල කර ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශයන් අනුව දෙසැම්බර් 31 දිනට ලැබීම් හා ගෙවීම් ගිණුමේ ශේෂය රු.437,517,439 ක් විය. නමුත් එම ශේෂය සනාථ කරන කිසිදු ලිඛිත සාක්ෂියක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ඇ) 1953 අංක 44 දරන පාඨශාලීය ගුරුවරුන්ගේ විශ්‍රාම වැටුප් පනත අනුව පනවන ලද නියෝග අංක 9 (අ) ප්‍රකාරව එක් එක් ආධාර මුදල් ගෙවන්නන්, ආණ්ඩුව විසින් අරමුදල සඳහා ගෙවන ලද සියළු ආධාර මුදල් පිළිබඳ විස්තර හා ආධාර මුදල් ගෙවන්නෙකුගේ මරණයේදී ඔහුට ගෙවිය යුතුව තිබෙන ආධාර මුදල් පිළිබඳ තොරතුරු ඇතුළත් ලේඛන පවත්වා ගත යුතු වුවත්, එවැනි ලේඛන කිසිවක් පවත්වා නොතිබුණි.

(ඈ) දකුණු හා වයඹ පළාත්වලට අදාල බැර නිවේදනයන් අමාත්‍යාංශයෙන් ගෙන්වා ගෙන නොතිබුණු අතර දකුණු පළාත් සභාවේ මාස 10 කට අදාලව හා උතුරු මැද පළාත් සභාවේ මාස 11 කට අදාලව අවකරණ ලේඛන කලාප කාර්යාලවලින් ලබාගෙන නොතිබුණු

බැවින් සමාලෝචිත වර්ෂයේ දායක මුදල් සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

### 1.2.2 පැහැදිලි නොකළ වෙනස්කම්

සමාලෝචිත වර්ෂයේ සදුකළ නියැදි පරීක්ෂණයේදී අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ලැබුණු බැර නිවේදන අනුව පළාත් දෙකකින් රු.155,556 ක් අරමුදලට බැර වී තිබුණද විගණනයට ඉදිරිපත් කළ අවකරණ ලේඛන අනුව එම පළාත් දෙකේ ගුරුවරුන්ගෙන් අයකර තිබූ දායක මුදල් රු.261,883 ක් වූයෙන් රු.106,327 ක වෙනසක් නිරීක්ෂණය විය.

### 1.2.3 නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම.

2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ්/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 04.1 (අ) ඡේදය ප්‍රකාරව වාර්ෂික අයවැය ලේඛනය විෂයභාර අමාත්‍යවරයා විසින් අනුමත කර නොතිබිණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රතිඵලය රු.119,639,248 ක අතිරික්තයක් වු අතර , ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.95,550,961 ක් වුයෙන් ඉකුත් වර්ෂය හා සසඳන විට මූල්‍ය ප්‍රතිඵලයේ රු. 24,088,287 ක හෙවත් සියයට 25 ක පමණ වර්ධනයක් පෙන්නුම් කෙරිණි.

සමාලෝචිත වර්ෂයේ දායක මුදල් ආපසු ගෙවීම් රු.4,706,791 කින් එනම් සියයට 53 කින් ඉහළයාම සිදුවී තිබුනද පොළී ආදායම රු.35,712,103 කින් එනම් සියයට 69 කින් හා දායක මුදල් ලැබීම රු.21,580,090 කින් එනම් සියයට 25 කින් ඉහළයාම අතිරික්තයේ වර්ධනයට ප්‍රධාන වශයෙන් ඉවහල් වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මෙහෙයුම් කාර්ය සාධනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මාසික සාමාජික දායක මදල් ලැබීම් රුපියල් මිලියන 5.6 සිට රුපියල් මිලියන 11.2 අතර පරාසයක පැවතුන අතර එක් එක් මාසයන්හි දායක මුදල් ලැබීම්වල උච්චාවචනයන් නිරීක්ෂණය විය. මාසිකව ලැබිය යුතු දායක මුදල කොපමණද යන්න ගණනය කිරීමේ ක්‍රමවේදයක් අරමුදල සතුව නොතිබු හෙයින් මුදලින් හා මාරු නියෝග යටතේ ලැබෙන දායක මුදල පමණක් වර්ෂයේ දායක මුදල ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුලදී රුපියල් මිලියන 51.9 ක පොළී ආදායමක් අරමුදලට ලැබී තිබුනද එම මුදලින් අරමුදලේ විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා කිසිදු මුදලක් උපයෝජනය කිරිමකින් තොරව අරමුදලට ලැබුණු දායක මුදල් ආපසු ගෙවීම සඳහා රුපියල් මිලියන 8.7 වැය කර ඉතිරි රුපියල් මිලියන 43.2 ක් ආයෝජනය කර තිබුණි. සියලුම විශ්‍රාම වැටුප් ගෙවීම් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ වැය ශීර්ෂයෙන් සිදුකර තිබුණි.

(ඇ) භාණ්ඩාගාරයේ උපදෙස් පරිදි 1953 අංක 44 දරන පාඨශාලීය ගුරුවරුන්ගේ විශ්‍රාම වැටුප් පනතින් පනවා ඇති නියෝග සුදුසු පරිදි සංශෝධනය කිරීම සඳහා පියවර ගෙන නොතිබුණි.

ඒ සම්බන්ධයෙන් 2013 ජුනි මාසයේදී පිරිවෙන් හා පෞද්ගලික පාඨශාලා ගුරුවරුන්ටද රජයේ විශ්‍රාම වැටුප් හා වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් හිමි ගන්වා ඇති නිසා නැවත රජයේ දායකය ගෙවීමක අවශ්‍යතාවක් දක්වා නොමැති බැවින් නියෝග සංශෝධනය කිරිමේ අවශ්‍යතාවක් පැන නොනැගුණ බැව් විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්වරයා මා වෙත දන්වා එවා තිබුණි.

## 4. <u>පද්ධති හා පාලනයන්</u>

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු පිළිබඳව වරින් වර විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අවධානයට යොමුකර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) ගිණුම්කරණය.

(ආ) අවකරණ ලේඛන පවත්වාගෙන යාම.

(ඇ) ආයෝජන.